(62)

පොලිස්පති චක්‍රලේඛ අංක:- 2197/09
ආයතන චක්‍රලේඛ අංක :- 16/09

මගේ අංකය:- DIG/WLF/01/09
පොලිස් මූලස්ථාය,
කොළඹ 01.
2009.11.13

සියළුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වරුන්,
නියෝජ්‍ය පොලිස්පති වරුන්,
අණදෙන නිලධාරී/අධ්‍යක්ෂ වරුන්,
කොට්ඨාශ භාර නිලධාරීන්,
දිස්ත්‍රික්ක භාර නිලධාරීන්,
ස්ථාන භාර නිලධාරීන් වෙත

රාජකාරියේ යෙදී සිටියදී මිය යන පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් සඳහා (මරණින් පසු) පශ්චාත් උසස්වීම් ලබාදීම.

01. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 31/88 පරිදි නුස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව මියයන පොලිස් නිලධාරීන්ට මෙන්ම නිලධාරියා/නිලධාරිනියගේ වරදක් නොමැතිව තම නීත්‍යානුකූල රාජකාරී ඉටු කිරීමට යාමේදී පහත සඳහන් කරුණු හේතුවෙන් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් ඝාතනයට ලක්වන පොලිස් නිලධාරීන්/නිලධාරිනියන් සඳහා පොලිස්පතිගේ අභිමතය හා නිර්දේශය අනුව පශ්චාත් උසස්වීම් ලබාදීමට ඉදිරිපත් කල 2009.08.10 දිනැති අංක 09/1554/305/059 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2009.08.19 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබාදී ඇත.

I. අපරාධකරුවන්ගේ ප්‍රහාර හා සැලසුම් හේතුවෙන්
II. මංකොල්ලකරුවන් විසින් සිදුකරන ප්‍රහාරයන් හේතුවෙන්,
III. මත්කුඩු, මත්ද්‍රව්‍ය හෝ නීතිවිරෝධී මත්පැන් ජාවාරම්කරුවන් විසින් සිදුකරන ප්‍රහාරයන් හේතුවෙන්
IV. වෙනත් ප්‍රවණ්කාරී ක්‍රියා මත හෝ ඉටු කරනු ලැබූ නීත්‍යානුකූල රාජකාරී වල ප්‍රතිඵලයක් වශයෙන් පළිගැනීමේ ප්‍රහාරයන්ට ලක්වීමෙන්
V. ප්‍රභූවරුන්ට ආරක්ෂාව සැපයීමේදී එම පුද්ගලයන්හට එල්ලවන ප්‍රහාරයන් හේතුවෙන්.

02. මෙම පශ්චාත් උසස්වීම් ලබාදීමේදී පහත පරිදි ක්‍රියා කළයුතුය.

I. මෙම නිලධාරීන් මියගිය දින සිට බලපැවැත්වෙන පරිදි රැලඟ තනතුරට/ශ්‍රේණියට පශ්චාත් උසස් ලබාදීම.
II. එම උසස්වීමට හිමි වැටුප් තලයේ තබා ගෙවීම් කටයුතු කිරීම
III. මෙම නිලධාරීන්/නිලධාරිනියන්ගේ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප්/මාසික වැටුප් හා අනෙකුත් දී දැනට නිකුත් කර ඇති චක්‍රලේඛ අනුව ගෙවීම.

03. මෙම චක්‍රලේඛයේ විධිවිධාන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද 2009.08.10 දින සිට ක්‍රියාත්මක කල යුතු

(විනිත්ද බාලසුරිය)
පොලිස්පති

DIG WLF-MS